*සැ. යු.-* 2024.08.23 දින පළ කරන ලද අංක 2399 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,400 - 2024 අගෝස්තු මස 30 වැනි සිකුරාදා - 2024.08.30**

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1830 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | — |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම *ගැසට්* පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 සැප්තැම්බර් මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් සැප්තැම්බර් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# රජයේ නිවේදන

## ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හම්බන්තොට

### ගල්විල පුරාණ රජමහා විහාරය - බිනර මහා පෙරහැර නියෝග

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උතුර මාගම් පත්තුවේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 121 පහළ බැරගම ග්‍රාමසේවා වසමට අයත් ගල්විල පුරාණ රජමහා විහාරස්ථානයේ බිනර මහා පෙරහැර මංගල්‍ය නියෝග යනුවෙන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් ජී. සී. ආර්. විජේවර්ධන වන මම වන්දනාගමන් ආඥාපනත යටතේ රෙගුලාසි බලපවත්නා කාලය වශයෙන් නියම කරමි.

2024 වර්ෂයේ බිනර මහා පෙරහැර මංගල්‍ය **2024.09.16 දින සිට 2024.09.28** වැනි දින දක්වා ක්‍රියාත්මක වේ.

ජී. සී. ආර්. විජේවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
හම්බන්තොට.

08 - 232

---

## සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

### සිවිල් ගුවන් සේවා අධිකාරිය

**1955 අංක 196 ගුවන් සංතරණ රෙගුලාසි යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෙරෙන දැනුම් දීම.**

පුද්ගලික ගුවන් මෙහෙයුම් (Private Operations), ගුවනේ දී සිදුකරන කාර්යයන් (Aerial Work) සහ අභ්‍යන්තර කුළී මෙහෙයුම් මගින් (Charter Air Service), මගීන් හා නැව් භාණ්ඩ ප්‍රවාහනය රට තුළ පවත්වාගෙන යාම සඳහා සිවිල් ගුවන් සේවා පනත (Act, No. 14 of 2010) හා ඊට අදාළ රෙගුලාසි හා කොන්දේසිවලට අනුකූලව ගුවන් මෙහෙයුම් සහතිකය සහ බලපත්‍රය ලබා ගැනීම සඳහා රත්මලාන, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි අවුරා එයාර්ලයින්ස් (පුද්ගලික) සමාගම (Aura Airlines (PVT) Ltd) විසින් 2024 ජූලි මස 02 දාතමින් ඉල්ලුම් පත්‍රයක් 2024 ජූලි මස 03 වැනි දින මෙම කාර්යාලය වෙත එවනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. ව්‍යාපාරික නාමය ලෙස අවුරා එයාර්ලයින්ස් (පුද්ගලික) සමාගම නමින් හඳුන්වන ආයතනය වෙළඳ නාමය වශයෙන් අවුරා එයාර්ලයින්ස් යන නම භාවිත කරයි. අයදුම්පතට අනුව අවුරා එයාර්ලයින්ස් (පුද්ගලික) සමාගමේ (Aura Airlines (PVT) Ltd) අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේ ය.

ටී. ඒ. සී. වී. තාම්බුගල මහතා
එස්. එම්. චාන්දනී මහත්මිය

අවුරා එයාර්ලයින්ස් (පුද්ගලික) සමාගමේ (Aura Airlines (PVT) Ltd) යෝජිත ගුවන් මෙහෙයුම් කටයුතු පිළිබඳ පූර්ණ වගකීම සහ කළමණාකාරීත්වය සඳහා එම්. කේ. ඉසුරු අර්ජිත මහතා නම් කරනු ලැබ ඇත.

අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක, සිවිල් ගුවන් සේවා අධිකාරියේ බිම් මහලේ පිහිටි තාක්ෂණික පුස්තකාලයේ තබා ඇති අතර ඕනෑම වැඩකරන දිනෙක කාර්යාල වේලාවන් තුළ මහජනතාවට පරීක්ෂා කර බැලීමට හැකිය.

යෝජිත මෙහෙයුම් සඳහා අවශ්‍ය ගුවන් මෙහෙයුම් සහතිකය (Air Operator Certificate) ඇතුළු අනෙකුත් අදාළ අනුමැතීන් ප්‍රදානය කිරීමට ප්‍රථම, සිවිල් ගුවන් සේවා පනත ගුවන් සංතරණ රෙගුලාසි මෙන්ම සහ මෙම ආයතනය විසින් පිළිගත් ඒ හා සම්බන්ධිත දේශීය අවශ්‍යතාවයන්ට අනුව නිරුපද්‍රිත වූත් ආරක්ෂිතවූත් කාර්යක්ෂමවූත් ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් පැවැත්වීම සඳහා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය සංස්ථාපිත ක්‍රියාමාර්ගානුකූලව නිසි පරිදි පරීක්ෂාකර බලා මෙම අයදුම්පත සහතික කිරීමේ වැඩපිළිවෙල **2024 ඔක්තෝබර් මස 09** වැනි දිනට පසුව මවිසින් ආරම්භ කිරීමට තීරණය කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත පරිච්ඡේදයේ සඳහන් දිනට දින 10කට ප්‍රථම ඕනෑම පුද්ගලයෙකු හට ඉහත කී අයදුම්පත සම්බන්ධව ලිඛිතව නිශ්චිත හේතු පදනම් කර ගත් කරුණු, 1955 අංක 197 දරන ගුවන් සංතරණ රෙගුලාසිවලට අනුකූලව මා වෙත සංදේශනය කළ හැකිය. අන්තර්ගත සියලු ප්‍රකාශනවල නිරවද්‍යතාවය ලිඛිත සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතුය.** එවැනි සංදේශන මා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඔහු/ඇය විසින් එහි පිටපතක් අයදුම්කරුට ලැබීමට සැලැස්විය යුතු අතර, එසේ යැවූ බවට සහතිකයක් අදාළ සංදේශයට අමුණා තිබිය යුතුය.

එයාර් වයිස් මාෂල් සාගර කොටකදෙනිය (විශ්‍රාමික),
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ
ජනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරී.

2024 අගෝස්තු මස 30 වැනි දින,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 152/1,
මිනුවන්ගොඩ පාර,
කටුනායක.

08-239

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.